Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 07 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 21 S I |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය දෙකයි**

**නම හා විභාග අංකය :**

උපදෙස් : ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

I කොටස

**පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදයේ අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) මේ දවස්වල ලොකු මාමාට <u>කරල පැහිලා</u> යැ'යි තාත්තා කීවේය.
i) සරු අස්වැන්නක් ලැබී ඇති බව. ii) හොඳ කාලයක් උදා වී ඇති බව.
iii) අමාරුවේ වැටී ඇති බව. iv) නරක කාලයක් උදා වී ඇති බව.

02) සිරිතුංග අසල් වැසියන් සමඟ <u>ඇයි හොඳයියක්</u> නැතැ'යි ගම්මු පවසති.
i) අමනාපයක්. ii) අකැමැත්තක්. iii) සුහදතාවයක්. iv) විශ්වාසයක්.

03) ගුරුතුමිය වාර විභාගයේ ලකුණු දෙන තුරු ළමයි <u>ඇඟිලි ගනිමින්</u> සිටියෝය.
i) නොඉවසිල්ලෙන් ii) බියෙන් iii) ඇඟිලි ගණන් කරමින් iv) පුදුමයෙන්

04) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ ඇති අල්පප්‍රාණ අක්ෂර ගණන වන්නේ,
i) 20 කි. ii) 10 කි. iii) 15 කි. iv) 5 කි.

05) පහත දැක්වෙන වචන අතුරෙන් මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත්වන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
i) සංස්කෘත. ii) වෘක්ෂය. iii) අක්ෂරය. iv) මණිමේඛලාව.

⋆ පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

06) භාග්‍යය i) වාසනාව. ii) අභාග්‍යය. iii) සම්පූර්ණ. iv) අසමාන.

07) මෛත්‍රිය i) මිත්‍රත්වය. ii) කරුණාව. iii) අවිහිංසාව. iv) වෛරය.

**⋆ පහත දැක්වෙන පදවලට සමානාර්ථයක් නොදෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

08) ජලය i) පැන්. ii) උදක. iii) වතුර. iv) අග්නි.

09) දුප්පත්. i) දිනිඳු. ii) දිළිඳු. iii) දුගී. iv) දරිද්‍ර.

**⋆ පහත දැක්වෙන අදහස් වලට ගැළපෙන තනි පදය තෝරන්න.**

10) තමාගේ වාසියට පමණක් කටයුතු කරන්නා,
i) පරාර්ථකාමියා. ii) හිංසාවාදියා . iii) ආත්මාර්ථකාමියා. iv) රණකාමියා.

11) ගලෙන් කරන ලද,
i) රන්මුවා. ii) රිදී මුවා. iii) සෙල්මුවා. iv) දැව වුමා.

12) පහත දැක්වෙන පද වලින් නාම විශේෂණ පදයක් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.
i) උණුවතුර. ii) සෙමින් දුවන. iii) යහපත් ළමයා. iv) මැටි භාණ්ඩ.

⋆ පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ගැලපෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

13) ගංගාවෝ ගලා ............................
i) බසියි. ii) බසිති. iii) බසින්නේය. iv) බසින්නීය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

14) .................................. මල් කඩා බුදුන් වැන්දාය.
i) උපාසිකාව. ii) උපාසකයා. iii) උපාසිකාවෝ. iv) උපාසකයෝ.

★ පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පදය අයත්වන ක්‍රියාපද වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

15) තෙල් ගාලා හිස පීරන් නෑනෝ.
i) පූර්ව ක්‍රියා. ii) මිශ්‍ර ක්‍රියා. iii) ආශිර්වාද ක්‍රියා. iv) විධි ක්‍රියා.

16) අපි මුදල් එකතු කර යාචකයාට දුන්නෙමු.
i) මිශ්‍ර ක්‍රියා. ii) පූර්ව ක්‍රියා. iii) අසම්භාව්‍ය ක්‍රියා. iv) විධි ක්‍රියා.

★ **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.**

17) අතු කඩා .................................. කන්නා වගෙයි.
i) දොඩම්. ii) කජු. iii) රඹුටන්. iv) මොර.

18) ඉඟුරු දීලා .......................... ගත්තා වගෙයි.
i) මිරිස්. ii) සල්ලි. iii) අඟුරු. iv) කහ.

19) පහත දැක්වෙන ග්‍රන්ථවලින් උපදේශාත්මක ග්‍රන්ථයක් නොවන ග්‍රන්ථය කුමක්දැ'යි තෝරා යටින් ඉරක් අඳින්න.
i) ලෝකෝපකාරය. ii) සිරිත් මල්දම. iii) කෝමල රේඛා iv) තිරුක්කුරල්.

20) " තොප්පි වෙළෙන්දා " නාට්‍යයට පදනම් වී ඇත්තේ,
i) නවකතාවකි. ii) ජන කතාවකි. iii) කෙටි කතාවකි. iv) ජාතක කතාවකි.

( ලකුණු 1 x 20 = 20)

## II කොටස

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න**

01) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.
i) අපි පොදු දේපල සුරකිමු. ii) පොත පත කියවීමේ අගය.
iii) මා කැමති ජාතික වීරවරයා iv) අපේ රටේ පැරණි සන්නිවේදන ක්‍රම.
v) එකමුතු වී මවුබිම සුරකිමු. ( ලකුණු 20 )

02) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| | පාඨය | පාඩම | පැවසුවේ කව්ද | පැවසුවේ කාටද | පැවසුවේ කුමන අවස්ථාවේද |
|---|---|---|---|---|---|
| 01 | " මම මඩොල්දූව නවකතාව කියවා වින්දනයක් ලැබුවා" | | | | |
| 02 | පනම් හතයි - ගජ ලාභයි හැම එකක්ම - එකම මිලයි | | | | |
| 03 | " අපි විවේකය ප්‍රයෝජනවත්ව ගත කිරීමට පුරුදු වුනා" | | | | |
| 04 | ඔය ප්‍රදර්ශන භූමියේ නිවේදන කියනවා ඇහෙන්නේ. | | | | |
| 05 | ඕවා උඹට අරන් දෙන්න මා ළඟ මිළ මුදල් කොයිද? | | | | |

( ලකුණු 20 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

රත්නදීප ජන්මභූමි
ලංකාදීප විජයභූමි
මේ අපේ උදාර වූ
මාතෘ භූමියයි.

ආදි සිංහලේ වීර මී මුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි.

මාණික්‍ය සේ පොලෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත වූ දූ පුතුන්
ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හෙළූ ලේ කඳයි

සින්ධුපමාන වැව් තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා නමා
සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි.

i) මෙම පද්‍ය පන්තියේ ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා යොදාගෙන තිබෙන නම් දෙකක් ලියන්න.
ii) මෙහි දැක්වෙන දීර්ඝ පාපිල්ල සහිත වචනයක් ලියන්න.
iii) පහත දැක්වෙන පදවලට සමාන පදයක් ලියන්න.
- මාණික්‍ය -
- පද්ම -

iv) පහත දැක්වෙන පදවල අර්ථ ලියන්න.
- සංග්‍රාම -
- අභීත -

v) මෙම පද්‍ය පන්තියේ දැක්වෙන මහප්‍රාණ අක්ෂර සහිත වචන දෙකක් ලියන්න.

( ලකුණු 10 )

04) පහත සඳහන් කවිවල හිස්තැන් පුරවන්න.

i) මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා
මා දුටු මුල් සඳු පෙන්නූ ලංකා
..........................................................
..........................................................

ii) උදව්වක් වශයෙන් කිසිවක් නොකළ කෙනෙකුට
.................................. ...............................................

( ලකුණු 10 )

05) පහත සඳහන් i , ii කොටස් වලින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

i) ඔබට අවශ්‍ය ළමා පොත් කිහිපයක මිල ගණන් දැනගැනීම සඳහා , කොළඹ 11 පිටකොටුවේ , ගුණසේන පොත් සමාගමේ කළමනාකාරතුමා වෙත යැවීම සඳහා සුදුසු ලිපියක් ලියන්න.

ii) ඔබ පාසලේ පැවැත්වෙන වාර්ෂික ක්‍රීඩා උත්සවය සඳහා සහභාගි වන ලෙස දන්වා ආරාධිතයන් වෙත යැවීමට සුදුසු නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න. ( ලකුණු 20 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# තෙවන වාර පරීක්ෂණය - 2019

## සිංහල භාෂාව හා සාහිත්‍යය

07 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | ii | 11 | iii |
| 02 | iii | 12 | ii |
| 03 | i | 13 | ii |
| 04 | ii | 14 | i |
| 05 | iv | 15 | iv |
| 06 | ii | 16 | ii |
| 07 | iv | 17 | iv |
| 08 | iv | 18 | i |
| 09 | i | 19 | iii |
| 10 | iii | 20 | ii |

### II කොටස

01) සමස්තය දෙස බලා රචනාවට ලකුණු ලබා දෙන්න.

02

| පාඩම | පැවසුවේ කවිද | පැවසුවේ කාටද | පැවසුවේ කුමන අවස්ථාවේද |
|---|---|---|---|
| පුස්තකාලයට පිය නගමු | සුධීර | ගුරුතුමියට | සිංහල කාල පරිච්ඡේදයේදී |
| තොප්පි වෙළෙන්දා | වෙළෙන්දා | අම්මාට | තොප්පි වෙළඳාමේ පැමිණි අවස්ථාවේදී |
| පුස්තකාලයට පිය නගමු | සිසුහු | ගුරුතුමියට | සිංහල පාඩමේ ගුරුතුමිය සිසුන් ඇගයීමට ලක්කිරීමේ දී |
| නිවේදන | අසිත | සමිතට | ප්‍රදර්ශනය බැලීමට ගිය අවස්ථාවේ |
| තොප්පි වෙළෙන්දා | අම්මා | ළමයාට | තොප්පි වෙළෙන්දා තොප්පි පෙන්වන අවස්ථාවේ |

03) 1. i රත්නදීප.
ii ලංකාදී.

2. හෙළු / හැළු , යන පදවලින් එකක්.
3. මාණික්‍ය - මැණික්, මිණි
පද්ම - නෙළුම්, පියුම්
4. සංග්‍රාම - යුද්ධ
අභීත - බිය නැති
5. නිධාන, අභීත, සින්ධුපමාන වැනි පදයක්

04) i) මා ගත් මුල් සුසුමත් දුන් ලංකා
මා පණ මෙන් ඔබ රක්නෙමි ලංකා

ii) කරන උපකාරය අහසටත් පොළොවටත් නොසමයි.

05) සමස්තය දෙස බලා ලකුණු ප්‍රදානය කරන්න.